# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,140 - 2019 සැප්තැම්බර් මස 06 වැනි සිකුරාදා - 2019.09.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1536 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1554 |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1553 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 1555 |


*සැ. යු.* - (i) ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 සැප්තැම්බර් මස 27 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 සැප්තැම්බර් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1535 - B 81558 — 5,403 (2019/09)

# තනතුරු - ඇබෑර්තු

## නියාගම ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියාගම ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩුව පවතින මුරකරු, වැඩ/ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු, රියදුරු, බර උපකරණ ක්‍රියාකරු තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිරව පදිංචි ඇති පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | සේවා ගණය සහ ශ්‍රේණිය | වැටුප් ක්‍රමය | අවම අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | මුරකරු | 01 | ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය | රා. ප. ච. 3/2016 අනුව PL1-2016 - රු. 24,250 - 250x10 - 270x10 - 300x10 - 330x12 - රු. 36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) සමත් වී තිබිය යුතු ය. |
| 02 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය | රා. ප. ච. 3/2016 අනුව PL1-2016 - රු. 24,250 - 250x10 - 270x10 - 300x10 - 330x12 - රු. 36,410 | 8 වන ශ්‍රේණිය (09 වසර) සමත් වී තිබිය යුතු ය. |
| 03 | සෞඛ්‍ය කම්කරු | 01 | ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය | රා. ප. ච. 3/2016 අනුව PL1-2016 - රු. 24,250 - 250x10 - 270x10 - 300x10 - 330x12 - රු. 36,410 | 8 වන ශ්‍රේණිය (09 වසර) සමත් වී තිබිය යුතු ය. |
| 04 | රියදුරු | 01 | ප්‍රාථමික ශිල්පීය III ශ්‍රේණිය | රා. ප. ච. 3/2016 අනුව PL3-2016 රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990 | I. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඕනෑම විෂයයන් 06ක් සමත් වී තිබිය යුතු ය.<br>II. පුරප්පාඩුව පවතින මෝටර් රථ වර්ගය ඇතුළුව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන බලපත්‍රයක් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද තිබීම. මේ සඳහා 2009 අංක 08 දරන මෝටර් රථ ප්‍රවාහන පනතේ 122 වගන්තිය යටතේ DE හෝ J කාණ්ඩයේ බලපත්‍රයක් ලබා තිබීම අනිවාර්ය නොවේ. තව ද, එකී පනතේ සඳහන් කරුණු හා ඒ සම්බන්ධව ඉදිරියේ දී සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත් වනු ඇත. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | සේවා ශ්‍රේණිය සහ ශ්‍රේණිය | වැටුප් ක්‍රමය | අවම අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 05 | බර උපකරණ ක්‍රියාකරු | 01 | ප්‍රාථමික ශිල්පීය III ශ්‍රේණිය | රා. ප. ච. 3/2016 අනුව PL3-2016 රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990 | I. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඕනෑම විෂයන් 06ක් සමත් වී තිබීම.<br>හෝ<br>5 ශ්‍රේණිය (6 වසර) සමත්ව තිබීම හා බර යන්ත්‍ර උපකරණ ක්‍රියා කිරීම පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br>II. බර වාහන ද ඇතුළුව පුරප්පාඩුව පවතින යන්ත්‍රෝපකරණ වර්ගය ක්‍රියාකරවීම හා පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද තිබීම. 2009 අංක 08 දරන මෝටර් රථ ප්‍රවාහන පනතේ 122 වගන්තියේ සඳහන් CE හෝ DE කාණ්ඩයේ බලපත්‍රයක් ලබා තිබීම අනිවාර්ය නොවන අතර, J කාණ්ඩයේ බලපත්‍රයක් ලබා තිබීම අනිවාර්ය වේ. තව ද, එකී පනතේ සඳහන් කරුණු හා ඒ සම්බන්ධව ඉදිරියේ දී සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත් වනු ඇත. |

02. *වයස් සීමාව* :

I. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

II. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

03. *පොදු සුදුසුකම්* :

I. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

II. ඉහත අනු අංක 04 හා 05 මගින් නිරූපිත රියදුරු හා බර උපකරණ ක්‍රියාකරු තනතුරු 02 සඳහා අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ පූර්වාසන්න වසර 05ක අනුගාමී වසර 03ක ස්ථිර පදිංචිකරුවන් විය යුතු අතර අනෙක් තනතුරු 03 හි අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතු අතර, පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය.

III. අයදුම්කරුවන් මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

IV. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු හෝ රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු ය.

V. අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

VI. අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියේ දක්වා ඇති සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ අවසාන දින වන විට සපුරා තිබිය යුතු ය.

VII. නියාගම ප්‍රාදේශීය සභාවේ දැනට සේවයේ නියුතු තාවකාලික/ අනියම්/ ආදේශක/ කොන්ත්‍රාත්/ ලියාපදිංචි පදනම මත සේවය කරනු ලබන සේවකයන් කෙරෙහි වැඩි අවධානය යොමු කරනු ලැබේ.

04. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි:*

I. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම නියාගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති සතු ය.

II. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මාස 3ක් ඇතුළත රජයේ වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂාවේ දී ශාරීරික හා මානසික වශයෙන් නුසුදුසු බවට පෙනී ගිය හොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. ඔබ ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතු වේ. වැන්දඹු පුරුෂ හා වැන්දඹු/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

II. පත්වීම අවුරුදු 3ක පරිවාස කාලයකට යටත් වේ.

III. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජය, දකුණු පළාත් සභාව, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා නියාගම ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

06. *බඳවා ගන්නා ක්‍රමය :*

I. අනු අංක 01, 02 හා 03 මගින් නිරූපිත මුරකරු, වැඩ/ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා වූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ ඇමුණුම 01 අනුව පහත සඳහන් පරිදි ලබාගත් උපරිම ලකුණු මත බඳවා ගනු ලැබේ.

| | *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 02 | අමතර සුදුසුකම් (උපලේඛන 02ට අනුව අදාළ නම්) | 10 | |
| 03 | පළපුරුද්ද (උපලේඛන 02ට අනුව අදාළ නම්) | 10 | |
| 04 | සභා බල ප්‍රාදේශයේ පදිංචි (එක් වසරකට ලකුණු 05 බැගින්) | 45 | |
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

*සටහන :*

1. මූලක සුදුසුකම් පරීක්ෂා කිරීම, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ම සිදු කෙරේ.

2. මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලැබූ කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

II. අනු අංක 04 හා 05 මගින් නිරූපිත රියදුරු හා බර උපකරණ ක්‍රියාකරු තනතුරු 02 සඳහා වූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට හා වෘත්තීය පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ උපලේඛන I අනුව පහත සඳහන් පරිදි ලබාගත් උපරිම ලකුණු මත බඳවා ගනු ලැබේ.

- *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

| | *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01.1 | අ. පො. ස. සා/පෙළ සාමාර්ථ සඳහා (8x1) | 08 | 40% |
| 1.2 | අ. පො. ස. සා/පෙළ සම්මාන සාමාර්ථ සඳහා (8x2) | 16 (උපරිම) | |
| | අ. පො. ස. උ/පෙළ සමත් වීම | 04 | |
| 02 | වෘත්තියට අදාළ දැනුම | 10 | |
| 03 | පෞරුෂත්වය | 05 | |
| 04 | වෘත්තියට අදාළව පුහුණුවක් හෝ සේවා පළපුරුද්දක් ලබා තිබීම (වසරකට ලකුණු 2 බැගින්) | 15 | |
| | එකතුව | 50 | |

- *වෘත්තීය පරීක්ෂණය :*

| | | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | වෘත්තියට අදාළ දැනුම පරීක්ෂා කිරීම | 50 | 40% |

07. *අයදුම් කළ යුතු ආකාරය* :

I. මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර ගන්නා අයදුම්පත් 2019.09.20 වැනි දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "සභාපති, නියාගම ප්‍රාදේශී සභාව, පෝද්දිවල, මත්තක" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. දක්වා ඇති උපදෙස්වලට පටහැනි අසම්පූර්ණ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

08. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපතක් අමුණා එවිය යුතු ය.

I. උප්පැන්න සහතිකය,
II. ජාතික හැඳුනුම්පත,
III. අධ්‍යාපන සහතික/ ශිෂ්‍ය කාර්ය දර්ශකය,
IV. පදිංචිය සනාථ කිරීමේ සහතිකය (පදිංචි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිතව මාස 06ක් තුළදී ලබාගත් ග්‍රාමසේවා සහතිකය),
V. මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක්,
VI. වෘත්තීය හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික (තිබේ නම්),
VII. සාපරාධී වරදක් සම්බන්ධයෙන් මෙතෙක් උසාවියකින් වරදකරුවෙකු කර නැති බව හා එවැනි වරදක් සම්බන්ධයෙන් දැනට පරීක්ෂණයට භාජනය නොවූ අයකු බවට තහවුරු කරන ලද පොලිස් සහතිකයක්,

09. මෙම දැන්වීම් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

ප්‍රසාද් වීරක්කොඩි,
සභාපති,
නියාගම ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 20 වැනි දින,
නියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියාගම ප්‍රාදේශීය සභාවේ ............................... තනතුර සඳහා අයදුම්පත

01. (i) මුලකුරු සමග නම : ...............................................................................
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම : .......................................................................

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ...............................................................................

03. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ...............................................................................

04. ස්ථිර පදිංචි ලිපිනය : ...............................................................................

05. ජාතික හැඳුනුම්පත් අංකය : ...............................................................................

06. ස්ත්‍රී/පුරුෂ භාවය : ...............................................................................

07. විවාහක/අවිවාහක බව : ...............................................................................

08. දුරකතන අංකය : ...............................................................................

09. උපන් දිනය : වර්ෂය : ....................... මාසය : ....................... දිනය : .......................

10 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : .......................
අවුරුදු : ....................... මාස : ....................... දින : .......................

11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? : .......................

12. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) : (සහතිකවල පිටපත් අමුණන්න) : .......................

13. වෘත්තීය හා වෙනත් සුදුසුකම් : (සහතිකවල පිටපත් අමුණන්න) : .......................

14. ඉල්ලුම්කරු දැනට රැකියාවක නියුතු නම්, : .......................
I. තනතුර : .......................
II. සේවය කරන ස්ථානය : .......................
III. පත්වීම් දිනය : .......................
IV. දරන තනතුරෙහි ස්වභාවය : .......................
(ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත/ආදේශක/අනියම්/කොන්ත්‍රාත්/ලියාපදිංචි යනාදී)

15. ඔබ කවරදාක හෝ සාපරාධී වරදක් හෝ චෝදනාවක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද?

16. ***අයදුම්කරුගේ සහතිකය*** : මෙම අයදුම්පතේ මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

දිනය : ....................... .......................,
අයදුම්කරුගේ අත්සන.

17. *රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.*

මෙම අයදුම්කරු දැනට දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවයේ නියුක්ත බව ද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද, මෙම තනතුර සඳහා තෝරාගතහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය නිදහස් කළ හැකි/නොහැකි බව ද ප්‍රකාශ කරමි.

දිනය : ....................... .......................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

09-165

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ - තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

### බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාතේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ පහත දැක්වෙන තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු වී ඇති තනතුරු වලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.09.26 වැනි දිනට හෝ එදිනට පෙර ''ලේකම්'' බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව, පානදුර පාර, බණ්ඩාරගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචි අයදුම්කරුවන්ට සහ මෙම සභාවේ දැනට අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂයෙන් සලකා බලනු ලැබේ.

**01. තනතුර - බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු :**

| | | | |
|---|---|---|---|
| 1.1 | පුරප්පාඩු සංඛ්‍යාව | - | 01 |
| 1.2 | වැටුප් කේත අංකය | - | PL-3-2016 |
| 1.3 | වැටුප් පරිමාණය | - | රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 |
| 1.4 | ආරම්භක වැටුප් තලය | - | රු. 25,790<br>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවීම් සිදු කරනු ලැබේ. |

02. බඳවා ගැනීමේ ක්‍රමය - සීමිත - (සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවලදී විවෘතව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.)

2.1 බඳවා ගන්නා ශ්‍රේණිය - III ශ්‍රේණිය

2.2 සුදුසුකම් :

2.2.1 *අධ්‍යාපන සුදුසුකම් :*

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයන් 06 ක් සමත්වී තිබීම. (මින් විෂයන් 05 ක් එකවර සමත්වී තිබිය යුතුය.)

බඳවා ගැනීමේදී අ.පො.ස. (සා. පෙළ) සමතුන් නොමැති විට 8 ශ්‍රේණිය සමතුන් බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.

2.2.2 *වෘත්තීය සුදුසුකම් :*

(i) බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ ''ඒ''පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ''ඩී'' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

(ii) අවම උස අඩි 05 ක් විය යුතුය.

(iii) බර යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද NVQ04 මට්ටමට අදාල සහතිකයක් තිබිය යුතුය.

(iv) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය.

2.2.3 *පළපුරුද්ද :*

(i) පළාත් පාලන ආයතනයක PL-1/PL-2 තනතුරක ස්ථිර කර තිබීම;

(ii) ඉහත 1 හි දැක්වෙන තනතුරක සේවා කාලය වසර 03 ක් සම්පූර්ණ කර තිබීම;

(iii) බර යන්ත්‍රෝපකරණ ක්‍රියා කරවීම පිළිබඳව මාස 06 ක පළපුරුද්දක් ලබා තිබීම.

2.2.4 *වෙනත්.-* අයදුම්පත් කැඳවීමේ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට මෙම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

2.2.5 වයස

(2.2.5.1) අවම සීමාව
(2.2.5.2) උපරිම සීමාව
} දැනටමත් සේවයේ නියුතු වන්නන් සඳහා වයස් සීමාවන් අදාල නොවේ.

2.2.6 *බඳවා ගැනීමේ ක්‍රමය* .- බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුව ව්‍යුහගත පරීක්ෂණයකට භාජනය කර සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ. තවද මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදුකරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| මාර්ග නීති පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 30 | 50% |
| යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය හා එහි පැවැත්ම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 50 | |
| ප්‍රායෝගික පරීක්ෂණය :<br>බඳවා ගැනීමට යෝජිත බර යන්ත්‍රෝපකරණ ක්‍රියා කරවීම පිළිබඳව අයදුම්කරුගේ ශිල්පීය හැකියාව හා ප්‍රවීණතාවය මෙහිදී පරීක්ෂා කරනු ලැබේ. | 15 | |
| පෞරුෂත්වය :<br>සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය පරීක්ෂා කිරීම | 5 | |

**සටහන :-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බැලේ.

03. *විවෘත බඳවා ගැනීම* :

3.1 බඳවා ගැනීමේ ශ්‍රේණිය : - III ශ්‍රේණිය
3.2 සුදුසුකම් :

3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා. පෙළ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයන් 06 ක් සමත්වී තිබීම. (මින් විෂයන් 05 ක් එකවර සමත්විය යුතුය.)
බඳවා ගැනීමේ දී අ.පො.ස. (සා. පෙළ) සමතුන් නොමැති විට 8 ශ්‍රේණිය සමතුන් බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.

3.2.2 වෘත්තීය සුදුසුකම් :

(i) බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් හෝ ''ඒ'' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ''ඩී'' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)
(ii) අවම උස අඩි 05ක් විය යුතුය.
(iii) බර යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද NVQ 04 මට්ටමට අදාල සහතිකයක් තිබිය යුතුය.
(iv) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය.

3.2.3 *පළපුරුද්ද* .- බර යන්ත්‍රෝපකරණ ක්‍රියා කරවීම පිළිබඳව එක් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

3.2.4 වයස :

3.2.4.1 අවම සීමාව - අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

3.2.4.2 උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

3.2.5 *බඳවා ගැනීමේ ක්‍රමය.* - බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුව ව්‍යුහගත පරීක්ෂණයකට භාජනය කර සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබාගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ. තවද මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදුකරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| මාර්ග නීති පිළිබඳව දැනුම පරීක්ෂා කිරීම | 30 | 50% |
| යාන්ත්‍රික ක්‍රියාකාරීත්වය හා එහි පැවැත්ම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 50 | |
| ප්‍රායෝගික පරීක්ෂණය :<br>බඳවා ගැනීමට යෝජිත බර යන්ත්‍රෝපකරණ ක්‍රියා කරවීම පිළිබඳව අයදුම්කරුගේ ශිල්පීය හැකියාව හා ප්‍රවීණතාව මෙහිදී පරීක්ෂා කරනු ලැබේ. | 15 | |
| පෞරුෂත්වය :<br>සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය පරීක්ෂා කිරීම | 5 | |

**සටහන** :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදි සලකා බැලේ.

**01. තනතුර - ආයුර්වේද ඖෂධ සංයෝජක :**

| | | | |
|---|---|---|---|
| 1.1 | පුරප්පාඩු සංඛ්‍යාව | - | 01 |
| 1.2 | වැටුප් කේත අංකය | - | PL 02- 2016 |
| 1.3 | වැටුප් පරිමාණය | - | රු. 25,250- 10 x 270- 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 |
| 1.4 | ආරම්භක වැටුප් තලය | - | රු. 25,250.00 |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදු කරනු ලැබේ.

02. *බඳවා ගැනීමේ ක්‍රමය - සීමිත*

**සටහන** - සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරිවීමට නොහැකි වන අවස්ථාවලදී විවෘත බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

2.1 බඳවා ගැනීමේ ශ්‍රේණිය - III ශ්‍රේණිය

2.2 සුදුසුකම් :

2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස (සා. පෙළ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයන් 06ක් සමත්වී තිබීම. (මින් විෂයන් 05 ක් එකවර සමත්විය යුතුය.)

2.2.2 පළපුරුද්ද :

(i) රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය විසින් පිළිගත් ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක වසරකට නොඅඩු කාලයක් ක්ෂේත්‍රයට අදාළ සේවා පළපුරුද්ද ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.); සහ

(ii) සීමිත බඳවා ගැනීමේදී අදාල පළාත් පාලන ආයතනයේ වසර පහක (05) ස්ථිර සේවා කාලයක් ඇති තනතුරේ ස්ථිර කරන ලද අයකුවීම හා එම කාලය තුළ කිසිදු විනය දඬුවමකට ලක් නොවී තිබීම.

2.2.3 වයස :

2.2.3.1 අවම සීමාව
2.2.3.2 උපරිම සීමාව
} දැනටමත් සේවයේ නියුතු වන්නන් සඳහා වයස් සීමාවන් අදාළ නොවේ.

2.2.4 *බඳවා ගැනීමේ ක්‍රමය* :- බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුව ව්‍යුහගත පරීක්ෂණයකට භාජනයකර සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතර සේවා කාලය | 30 | 50% |
| වැඩ බලන හෝ රාජකාරි ඉටු කිරීම | 25 | |
| දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය හා ඖෂධ පිළිබඳ මූලික දැනුම | 40 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

**සටහන** :- ලකුණු ලබා ගැනීමේ කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුකරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහිදී සලකා බැලේ.

03. විවෘත බඳවා ගැනීම :

3.1 බඳවා ගැනීමේ ශ්‍රේණිය - III ශ්‍රේණිය :

3.2 සුදුසුකම් :

3.2.1 *අධ්‍යාපන සුදුසුකම්* :

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයන් 06 ක් සමත්වී තිබීම. (මින් විෂයන් 05 ක් එකවර සමත්විය යුතුය.)

3.2.2 *පළපුරුද්ද* :

(1) රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය විසින් පිළිගත් ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක වසරකට නොඅඩු කාලයක් ක්ෂේත්‍රයට අදාළ සේවා පළපුරුද්ද ලබා තිබීම.

3.2.3 වයස :

3.2.3.1 *අවම සීමාව* - අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

3.2.3.2 *උපරිම සීමාව* - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

3.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : - බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුව ව්‍යුහගත පරීක්ෂණයකට භාජනය කර සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් :<br>බඳවා ගැනීමේ මූලික සුදුසුකම ලෙස දක්වා ඇති අ.පො.ස. (සා.පෙළ) විභාග යේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02) ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>* සාමාන්‍ය සාමාර්ථයට ලකුණු - 04<br>* සම්මාන සාමාර්ථයට ලකුණු - 06<br>* අධි සම්මාන සාමාර්ථයට ලකුණු - 08<br>* විශිෂ්ඨ සම්මානයට ලකුණු - 10 | 20 | 50% |
| *දේශීය ඖෂධ පිළිබඳ ඇති අවබෝධය :*<br>දේශීය ඖෂධ හඳුනා ගැනීම, එහි ගුණාගුණ පිළිබඳව ඇති මූලික දැනුමවිමසා බැලේ. | 75 | |
| පෞරුෂත්වය :<br>සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම. | 05 | |
| **මුළු ලකුණු** | **100** | |

**01. තනතුර - මුරකරු**

1.1 පුරප්පාඩු සංඛ්‍යාව - 01
1.2 වැටුප් කේත අංකය - PL-1- 2016
1.3 වැටුප් පරිමාණය - රු. 24,250- 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410
1.4 ආරම්භක වැටුප් තලය - රු. 24,250.00

රා.ප.ච. 3/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදු කරනු ලැබේ.

02. බඳවා ගැනීමේ ක්‍රමය - විවෘත

විවෘත බඳවා ගැනීම :

2.1 බඳවා ගැනීමේ ශ්‍රේණිය - III ශ්‍රේණිය

2.2 සුදුසුකම් :

2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයන් 06 ක් සමත්වී තිබීම, (මින් විෂයන් 05 ක් එකවර සමත්විය යුතුය.)

බඳවා ගැනීමේ දී අ.පො.ස. (සා. පෙළ) සමතුන් නොමැති විට 8 ශ්‍රේණිය සමතුන් බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.

2.2.2. වයස :

2.2.2.1 අවම සීමාව - අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

2.2.2.2 උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

2.2.3 *බඳවා ගැනීමේ ක්‍රමය.-* බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුව ව්‍යුහගත පරීක්ෂණයකට භාජනය කර සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්<br><br>බඳවා ගැනීමේ මූලික සුදුසුකම ලෙස දක්වා ඇති අ.පො.ස. (සා. පෙළ)විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02) ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br><br>* සාමාන්‍ය සාමාර්ථයට - ලකුණු 04<br>* සම්මාන සාමාර්ථයට - ලකුණු 06<br>* අධි සම්මාන සාමාර්ථයට - ලකුණු 08<br>* විශිෂ්ඨ සම්මානයට - ලකුණු 10 | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුනු සලකා බැලීම | 05 | |
| **මුළු ලකුණ** | **100** | |

***සටහන*** :- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙලට අනුව පත්වීම් කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහි දී සලකා බලනු ලැබේ.

01. **තනතුර - සෞඛ්‍ය කම්කරු**

1.1 පුරප්පාඩු සංඛ්‍යාව - 02

1.2 වැටුප් කේත අංකය - PL-1-2016

1.3 වැටුප් පරිමාණය - රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410

1.4 ආරම්භක වැටුප් තලය - රු. 24,250.00
රා. ප. ච. 3/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදු කරනු ලැබේ.

02. බඳවා ගැනීමේ ක්‍රමය :- විවෘත

*විවෘත බඳවා ගැනීම*

2.1 බඳවා ගැනීමේ ශ්‍රේණිය - III ශ්‍රේණිය
2.2 සුදුසුකම් :
2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

අවම වශයෙන් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.

2.2.2 වයස :

2.2.2.1 අවම සීමාව - අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

2.2.2.2 උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

2.2.3 බඳවා ගැනීමේ ක්‍රමය :- බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුව ව්‍යුහගත පරීක්ෂණයකට භාජනය කර සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම) | 05 | |
| මුළු ලකුණු | 100 | |

***සටහන.***- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙලට අනුව පත්වීම කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ.

**01. තනතුර - ආදාහනාගාර ක්‍රියාකරු සහායක**

| | | | |
|---|---|---|---|
| 1.1 | පුරප්පාඩු සංඛ්‍යාව | - | 02 |
| 1.2 | වැටුප් කේත අංකය | - | PL- 1- 2016 |
| 1.3 | වැටුප් පරිමාණය | - | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 |
| 1.4 | වැටුප් තලය | | රු. 24,250.00 |

රා. ප.ච. 3/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදු කරනු ලැබේ.

02. *බඳවා ගැනීමේ ක්‍රමය : විවෘත*

*විවෘත බඳවා ගැනීම*

2.1 බඳවා ගැනීමේ ශ්‍රේණිය - III ශ්‍රේණිය

2.2 සුදුසුකම් :

2.2.1 අධ්‍යාපන සුදුසුකම් :
අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්වී තිබීම. (මින් විෂයයන් 05 ක් එකවර සමත්විය යුතුය.)
බඳවා ගැනීමේ දී අ.පො.ස. (සා. පෙළ) සමතුන් නොමැති විට 8 ශ්‍රේණිය සමතුන් බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.

2.2.2 වයස :

2.2.2.1 අවම සීමාව : - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.
2.2.2.2 උපරිම සීමාව : - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

2.2.3 *බඳවා ගැනීමේ ක්‍රමය* : - ව්‍යුහගත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්<br><br>බඳවා ගැනීමේ මූලික සුදුසුකම ලෙස දක්වා ඇති අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02) ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>* සාමාන්‍ය සාමාර්ථයට ලකුණු - 04<br>* සම්මාන සාමාර්ථයට ලකුණු - 06<br>* අධි සම්මාන සාමාර්ථයට ලකුණු - 08<br>* විශිෂ්ට සම්මානයට ලකුණු - 10 | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම) | 05 | |
| මුළු ලකුණු | 100 | |

***සටහන*** .- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙලට අනුව පත්වීම් කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ.

**01. තනතුර - වැඩ ක්ෂේත්‍ර කම්කරු**

1.1 පුරප්පාඩු සංඛ්‍යාව - 01
1.2 වැටුප් කේත අංකය - PL1-2016
1.3 වැටුප් පරිමාණය - රු. 24,250- 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410
1.4 වැටුප් තලය - රු. 24,250.00
රා. ප. ච. 3/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදු කරනු ලැබේ.

02. බඳවා ගැනීමේ ක්‍රමය :- විවෘත

විවෘත බඳවා ගැනීම

2.1 බඳවා ගැනීමේ ශ්‍රේණිය - III ශ්‍රේණිය
2.2 සුදුසුකම් :

2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

අවම වශයෙන් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.

2.2.2 වයස :

2.2.2.1 අවම සීමාව - අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.
2.2.2.2 උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

2.2.3 *බඳවා ගැනීමේ ක්‍රමය* - බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුව ව්‍යුහගත පරීක්ෂණයකට භාජනය කර සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්,ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම) | 05 | |
| මුළු ලකුණු | 100 | |

**සටහන** .-පවත්නා පුරප්පාඩු සඳහා වැඩි ම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදි සලකා බලනු ලැබේ.

**01. තනතුර - පුස්තකාල සහායක**

1.1 පුරප්පාඩු සංඛ්‍යාව - 01
1.2 වැටුප් කේත අංකය - PL1- 2016
1.3 වැටුප් පරිමාණය - රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410
1.4 වැටුප් තලය - රු. 24,250.00

රා.ප.ච. 3/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදු කරනු ලැබේ.

02. බඳවා ගැනීමේ ක්‍රමය - විවෘත

විවෘත බඳවා ගැනීම :

2.1 බඳවා ගැනීමේ ශ්‍රේණිය : - III ශ්‍රේණිය
2.2 සුදුසුකම් :

2.2.1 *අධ්‍යාපන සුදුසුකම් :*

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 ක් සමත්වී තිබීම. (මින් විෂයයන් 05 ක් එකවර සමත්විය යුතුය.)

බඳවා ගැනීමේදී අ.පො.ස. (සා. පෙළ) සමතුන් නොමැති විට 8 ශ්‍රේණිය සමතුන් බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.

2.2.2 *වයස :*

2.2.2.1 අවම සීමාව - අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නො අඩු විය යුතුය.

2.2.2.2 උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

2.2.3 *බඳවා ගැනීමේ ක්‍රමය:-* ව්‍යුහගත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම් සිදුකරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීම සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්<br>බඳවා ගැනීමේදී මූලික සුදුසුකම ලෙස දක්වා ඇති අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී සාමාර්ථය ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02) ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>* සාමාන්‍ය සාමාර්ථයට - ලකුණු -04<br>* සම්මාන සාමාර්ථයට - ලකුණු -06<br>* අධි සම්මාන සාමාර්ථයට - ලකුණු 08<br>* විශිෂ්ඨ සම්මානයට - ලකුණු 10 | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම) | 05 | |
| මුළු ලකුණු | 100 | |

***සටහන***- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙලට අනුව පත්වීම් කරනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ.

ඉහත සඳහන් කරන ලද සියලු තනතුරු සඳහා අදාළ සුදුසුකම්වලට අමතරව පහත දැක්වෙන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

1. *පොදු සුදුසුකම් :*

i. අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වර්ෂ 03 ක කාලයක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. (බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.) ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් සහතික කරනු ලබන ග්‍රාම නිලධාරි සහතිකයකින් සනාථ විය යුතුය;

ii. තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය;

iii. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය;

iv. අයදුම්කරු පරම්පරාවෙන් ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය;

v. සීමිත අයදුම්කරුවන් ඉල්ලුම්පත් භාරගැනීමේ අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 05 ක කාලය තුළ වරදකට (අවවාද කිරීමකට හැර) දඬුවමක් ලබා නොමැත්තාවූ ද, සතුටුදායක සේවා කාලයක් සපුරන අයකු විය යුතුය;

vi. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින් තනතුරු සඳහා අයදුම් කිරීමේදී රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල සංස්ථා සේවයෙන් පහ කරනු ලබන ලැබූවෙකු නොවිය යුතුය.

2. *සේවය නියුක්ත කිරීමේ කොන්දේසි* :

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතුය;

ii. බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු කාලයකට යටත් වන්නේය./ශ්‍රේණිගත උසස් වීමක් නම් එක් අවුරුදු 1 ක වැඩ පරීක්ෂක කාල සීමාවකට යටත් විය යුතුය;

iii. ඉහත තනතුරු යටතේ බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය;

iv. මෙම සේවයේ සේවකයින් ස්ථාන මාරු කිරීම්වලට යටත් වේ. පළාත් පාලන ආයතනවල ස්ථාන මාරු කිරීමේ බලය ඒ ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රධානියා සතු වේ. තවද පළාත් පාලන ආයතන අතර ස්ථාන මාරු කිරීම් ඒ ඒ පළාත් පාලන ආයතන ප්‍රධානියා රජය පිළිගත් නීතිරීතීවලට යටත්ව තීරණය කළ හැකි වේ;

v. මෙම බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට ද රජය පළාත් සභාවේ හෝ දෙපාර්තමේන්තු හෝ සභාවේ නියෝගවලට ද, වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලවය. ඒ අනුව ක්‍රියා කිරීමට පත්වීම්ලාභීන් බැඳී සිටිය යුතුය.

3. *අයදුම්කිරීමේ ක්‍රමය* :

i. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික පත්‍රවල ඡායාපිටපත් අමුණා එවිය යුතුය. මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.
   (1) උප්පැන්න සහතිකය;
   (2) ජාතික හැඳුනුම්පතේ පිටපත;
   (3) මූලික අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන ලියවිලි;
   (4) වෘත්තීය හෝ පළපුරුද්ද සනාථ කෙරෙන ලියවිලි;
   (5) තම පදිංචිය සනාථ කිරීම පිණිස මෑතකදී ලබා ගත් ග්‍රාමසේවා සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ යුතුය.

ii. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ,

iii. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ බඳවා ගැනීමට නියමිත තනතුරු සංඛ්‍යාව සංශෝධනය/තීරණය කිරීම හෝ මෙම නිවේදන අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය,

iv. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ අයදුම්පත් යොමු කරන තනතුර, *ගැසට්* නිවේදනයේ සඳහන් පරිදි පැහැදිලිව සටහන් කළ යුතුය. අසම්පූර්ණ හා 03 ඡේදය යටතේ සඳහන් සහතිකවල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

v. ආයතනගත අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vi. සම්මුඛ පරීක්ෂණයට කැඳවීම පත්වීම් ලැබීමට සුදුසුකමක් සපුරා ඇති බවට හෝ පත්වීම් ලබා දීම සඳහා අනිවාර්ය බැඳීමකට යටත් නොවේ.

බී. ඩී. ඒ. කේ. ගයන්ති,
ලේකම්,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 23 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව,
පානදුර පාර,
බණ්ඩාරගම.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව**

*............................................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.
03. ස්ථිර ලිපිනය :——————————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
05. උපන් දිනය : වර්ෂය :—————— මාසය :—————— දිනය :——————
06. අයදුම්පත් භාරගන්නා 2019.09.26 දිනට වයස : අවු :—————— මාස :—————— දින :——————
07. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.
08. විවාහක/අවිවාහක බව :——————————————.
09. ජාතිය :——————————————.
10. ඔබ දැනටමත් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්........................................................ දරන තනතුර, සේවා කාලය, එම පත්වීම් ස්ථිරද/තාවකාලිකද/අනියම්ද/කොන්ත්‍රාත් ද යන වග :——————————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————————.
12. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායාපිටපත් අමුණා එවිය යුතුය) :——————————————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————————.

——————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

*දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන.............................................................................................. මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) පදනම මත ................................................ කු වශයෙන් සේවය කරයි. ඔහු/ඇය අයදුම්කරන තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයෙන් නිදහස් කළහැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමකට හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————————.
තනතුර :——————————————.
දෙපාර්තමේන්තුව :——————————————.
නිල මුද්‍රාව :——————————————.
දිනය :——————————————.

09-306

---

**සංශෝධනයයි**

**පානදුර ප්‍රාදේශීය සභාව**

2019.08.23 දින පළකරන ලද අංක 2138 දරන *ගැසට් පත්‍රයේ* 08-1004 නිවේදනයේ අනු අංක 04 යටතේ වූ සෞඛ්‍ය කම්කරු III තනතුර සඳහා වූ පුරප්පාඩු ගණන 01 ක් ලෙස හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.09.16 දක්වා දීර්ඝ කරන ලද බවත් නිවේදනය කරනු ලැබේ.

ලේකම්,
පානදුර ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 05 වැනි දින,
පානදුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-699

# පළාත් පාලන නිවේදන

## පේදුරුතුඩුව නගර සභාව

### දේපළ බදු අයකිරීම - 2019

පේදුරුතුඩුව නගර සභාවේ සභාපති ජොෂප් ඉරුදයරාජා වන මම, 1939 වසරේ අංක 61 දරන නගර සභා ආඥපනතේ (255 වන අධිකාරය) 166 වැනි වගන්තිය යටතේ පේදුරුතුඩුව නගර සභාවට පවරන ලද බලතලවලට අනුව 2018.11.23 වැනි දින තීරණය අංක C164 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ජොෂප් ඉරුදයරාජා,
සභාපති,
පේදුරුතුඩුව නගර සභාව.

2019 අප්‍රේල් මස 12 වැනි දින,
පේදුරුතුඩුව නගර සභා කාර්යාලය,
පේදුරුතුඩුව.

යෝජනා අංකය : C164/ 2018.11.23

1939 වසරේ අංක 61 දරන නගර සභා ආඥපනතේ (255 වන අධිකාරය) නගර සභා ආඥපනතේ 166 වැනි වගන්තිය යටතේ පේදුරුතුඩුව නගර සභාවට පවරන ලද බලතලවලට අනුව ප්‍රදේශය තුළ පිහිටා ඇති නිවාස, ගොඩනැගිලි, ඉඩම්, කුඩා නිවාස යනාදියට නියම කරන ලද බලතල ප්‍රකාරව එම දේපළ මත තක්සේරු කරන ලද වර්ෂයේ වටිනාකමින් පළමු කාර්තුවට සියයට දොළහක් (12%) බැගින් ද ඊළඟ කාර්තු තුන සඳහා සියයට දහයක් (10%) බැගින් ද වාර්ෂික දේපළ බද්ද අය කළ යුතුය.

තව ද, 2019 වර්ෂයේ පහත වගුවේ සඳහන් කර ඇති එක් එක් කාර්තුවක් වෙනුවෙන් සඳහන් කර ඇති දිනට පෙර වාර්ෂික තක්සේරු බද්ද පේදුරුතුඩුව නගර සභාවේ අරමුදලට ගෙවිය යුතු බවත්, වර්ෂයේ පළවෙනි කාර්තුව සඳහා බදු මුදල ජනවාරි මස 31 වන දිනට පෙර ද, ඊළඟ කාර්තු තුන සඳහා අප්‍රේල් මස 31 වන දිනට පෙර ද ගෙවනු ලැබුවහොත් සියයට දහයක් (10%) අඩුකිරීමක් ද, මෙම වගුවේ සඳහන් කර ඇති එක් එක් කාර්තුව සඳහා තුන්වෙනි තීරයේ සඳහන් කර ඇති දිනට පෙර අදාළ බදු ප්‍රතිශත ප්‍රමාණය පේදුරුතුඩුව නගර සභාවේ අරමුදලට ගෙවනු ලැබුවහොත් එක් කාර්තුවක් සඳහා නියමිත ප්‍රමාණයෙන් සියයට පහ (05%) මුදල් වට්ටමක්ද පේදුරුතුඩුව නගර සභාව විසින් ලබාදිය යුතු බවත් නියමිත කාර්තුව තුළ බද්ද ගෙවීම නොකළහොත් ඒ සඳහා පිළි-වෙළින් භාවිතා නොකරන ඉඩම් හා පදිංචි ස්ථානවලට සියයට පහළොවක (15%) ප්‍රතිශතයකුත්, ව්‍යාපාර ස්ථානවලට සියයට විස්සක (20%) ප්‍රතිශතයකුත් අධිභාර වැයක් (දඩයක්) ලෙස අයකිරීමට තීරණය කරමි.

#### උපලේඛනය - 01

| *වාරිකය* | *ගෙවිය යුතු දිනය* | *සියයට පහක වට්ටම සඳහා නියමිත අවසාන දිනය* |
|---|---|---|
| පළවෙනි කාර්තුව | 2019.03.31 ට පෙර | 2019.01.31 |
| දෙවෙනි කාර්තුව | 2019.06.30 ට පෙර | 2019.04.30 |
| තුන්වෙනි කාර්තුව | 2019.09.30 ට පෙර | 2019.07.31 |
| හතරවෙනි කාර්තුව | 2019.12.31 ට පෙර | 2019.10.31 |

09-112

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## නවගත්තේගම ප්‍රාදේශීය සභාව

ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 විධිවිධානවලට අනුකූලවන පහත පරිදි පහත උපලේඛන වල සඳහන් විගණනය කරන ලද නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, 2018.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රකාශයට පත් කරනු ලැබේ.

උපලේඛන I - 2018.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

උපලේඛන II - 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය

උපලේඛන I

**නවගත්තේගම ප්‍රාදේශීය සභාව**

2018 දෙසැම්බර් මස 31 දිනට

***මූල්‍ය තත්වය පිළිබඳව ප්‍රකාශය***

| *වත්කම්* | *සටහන්* | *2017.12.31* | *2018.12.31* |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 6 | 134,172,081.03 | 145,982,159.70 |
| ජංගම වත්කම් | | | |
| තොග | 7 | 516,278.96 | 1,699,610.27 |
| සේවක ණය හා අත්තිකාරම් | 8 | 4,086,185.15 | 4,379,998.15 |
| ලැබිය යුතු දෑ | 9 | 20,230,145.08 | 11,083,843.54 |
| ආයෝජන | 10 | 325,831.98 | 381,242.59 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 11 | 2,684,420.87 | 1,969,564.27 |
| **මුළු වත්කම්** | | **162,014,943.07** | **165,496,418.52** |
| | | | |
| ***වගකීම්*** | | | |
| ජංගම නොවන වගකීම් | 12 | - | - |
| ජංගම වගකීම් | 13 | 13,797,440.79 | 3,698,609.59 |
| හිමිකම් | 14 | 148,217,502.28 | 161,797,808.93 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **162,014,943.07** | **165,496,418.52** |

උපලේඛන II

නවගත්තේගම ප්‍රාදේශීය සභාව

*2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*
*මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය*

| | *සටහන්* | *2017.12.31* | *2018.12.31* |
|---|---|---|---|
| **මෙහෙයුම් අයභාරය** | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්ථන | 1 | 20,646,123.59 | 23,377,571.06 |
| වෙනත් අයභාර | 2 | 11,774,222.02 | 10,876,267.93 |
| මුළු මෙහෙයුම් අයභාරය | | **32,420,345.61** | **34,253,838.99** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුනරාවර්ථන වියදම | 3 | 29,004,663.16 | 32,500,687.83 |
| මුළු මෙහෙයුම් වියදම | | **29,004,663.16** | **32,500,686.83** |
| **වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය** | | **3,415,682.45** | **1,753,151.16** |
| ප්‍රාග්ධන ලැබීම් | 4 | **17,953,577.93** | **5,324,558.68** |
| ප්‍රාග්ධන වියදම් | 5 | 19,312,931.24 | 5,675,098.48 |
| **වර්ෂය සඳහා වන අතිරික්තය/ඌණතාවය** | | **2,056,329.14** | **1,402,611.36** |

09-103

---

# විවිධ දැන්වීම්

## සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව

ගංගා වැලි ප්‍රවාහනය වෙනුවෙන් සභාව සතු මාර්ග භාවිතය වෙනුවෙන් අය කරනු ලබන සංශෝධිත ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ VII වන උපවගන්තිය (ඇ) උපවගන්තිය ප්‍රකාරව 2019.09.01 දින සිට ගංගා වැලි/ගොඩ වැලි ප්‍රවාහනය කිරීම වෙනුවෙන් එක් වැලි කියුබ් 1 ක් සඳහා මසකට අය කරනු ලැබූ ගාස්තුව රු. 100.00 වෙනුවට රු. 250.00 ක් දක්වා ගාස්තුවක් අය කිරීමට 2019.08.09 වන දින පැවති මාසික සභාවේ දී සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව විසින් තීරණය කොට අය කරන බව මෙයින් නිවේදනය කරමි.

ජනහිතකාමී කීර්ති ශ්‍රී දේශමාන්‍ය,
ඩබ්. පී. සමන් වර්ණකුලසූරිය,
සභාපති,
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව.

2019 අගෝස්තු මස 19 වැනි දින,
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-563

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | *රු.* | *ශ.* |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට | ... | ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට | ... | ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2019** වර්ෂය | | | |
| **සැප්තැම්බර්** | 2019.09.06 | සිකුරාදා | 2019.08.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.09.12 | බ්‍රහස්පතින්දා | 2019.08.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.09.20 | සිකුරාදා | 2019.09.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.09.27 | සිකුරාදා | 2019.09.12 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2019.10.04 | සිකුරාදා | 2019.09.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.10.11 | සිකුරාදා | 2019.09.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.10.18 | සිකුරාදා | 2019.10.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.10.25 | සිකුරාදා | 2019.10.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2019.11.01 | සිකුරාදා | 2019.10.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.11.08 | සිකුරාදා | 2019.10.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.11.15 | සිකුරාදා | 2019.11.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.11.22 | සිකුරාදා | 2019.11.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.11.29 | සිකුරාදා | 2019.11.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.